# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2455/13 - 2025 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2025.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ගුරු උපදේශක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

02 වන සංශෝධනය

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2020 ජූලි මස 01 දිනැති අංක 2182/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ගුරු උපදේශක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2025 සැප්තැම්බර් මස 18 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01 – 2022 ඔක්තෝබර් මස 04 වැනි දින හා අංක 2300/09 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

7.2.4.1 ලිඛිත විභාගය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණය, නූතන අධ්‍යාපන ව්‍යවහාර ආශ්‍රිතව සිද්ධි අධ්‍යයනයක් | 100 | 40 |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7.2.4.4 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| **I කොටස** | | |
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| 2. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | 05 | |
| 3. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාව | 05 | |
| **II කොටස ප්‍රායෝගික පරීක්ෂණය** | | |
| 1. ප්‍රායෝගික ඉගැන්වීමේ කුසලතාව ඉගෙනුම් / ඉගැන්වීම් ක්‍රමවේද | 130 | 75 |

"අ " පරිශිෂ්ටයේ අනු අංක 01, 02.1, 02.2 සහ 05 යටතේ සඳහන් සියලුම කරුණු වෙනුවට පහත සඳහන් කරුණු ඇතුලත් කරනු ලැබේ.

01. ලිඛිත විභාගය

| *විෂයයන්* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණය, නූතන අධ්‍යාපන ව්‍යවහාර ආශ්‍රිතව සිද්ධි අධ්‍යයනයක් | පැය 03 | 100 |

02. විෂය නිර්දේශය

02.1 ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණ, නූතන අධ්‍යාපන ව්‍යවහාර ආශ්‍රිතව සිද්ධි අධ්‍යයනයක් (කාලය පැය - 03)

සෛද්ධාන්තික දැනුම මත පමණක්ම නොව අධ්‍යාපන උපදේශකවරුන් වශයෙන් ප්‍රායෝගික අත්දැකීම් මත තමාගේ නිර්මාණාත්මක කුසලතා, අධ්‍යාපන විෂයමාලා සමාන්තර හා සහානුකරණය මත පදනම් කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පහත ක්ෂේත්‍ර ආශ්‍රිත කෙටි ප්‍රශ්න සිද්ධි අධ්‍යයනය කර ඉදිරිපත් කිරීමක් කරනු ලැබිය යුතුය.

I. අධ්‍යාපන මනෝ විද්‍යාවට අදාළ සංකල්ප

II. කළමනාකරණ සංකල්ප හඳුනා ගැනීම හා අධ්‍යාපන කළමනාකරණයේ පංචවිධ කාර්යභාරය

III. ඉගෙනුම, ඉගැන්වීම, ඇගයුම හා අධීක්ෂණ ක්‍රියාවලි, ඉහත ක්‍රියාවලියේ ගුරුවරයාගේ භූමිකාව හා සැමට අධ්‍යාපනයේ වැදගත්කම

IV. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හා පන්ති කාමරයේ ව්‍යවහාර පන්ති කාමර ගැටලු විසදීම
උදා:- පන්ති කළමනාකරණය, අවම සම්පත්වලින් උපරිම ලෙස ඵලදායීතාව ලබා ගැනීමේ විධි

V. විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම

VI. ගුරු කුසලතා ඇගයීමේ ක්‍රම

VII. අධීක්ෂණ මූලධර්ම, අධීක්ෂණ සිදු කරන ආකාර, මුහුණපාන ගැටලු හා විසඳුම්

VIII. පාසල් විෂය මාලාවේ ස්වභාවය, විෂයමාලාව මගින් පාසල සම්බන්ධ කළ හැකි ආකාරය හා වෘත්තීය නැඹුරුව ඇති කළ හැකි අයුරු

IX. විවිධ අධ්‍යාපන පර්යේෂණ ප්‍රවේශ, දත්ත රැස් කිරීමේ ක්‍රම හා විශ්ලේෂණය කිරීම

02.2 සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ.

05. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පවත්වනු ලබන ප්‍රායෝගික ඉගැන්වීමේ කුසලතාවය (ඉගෙනුම් / ඉගැන්වීම් ක්‍රමවේද හා ක්‍රම ශිල්ප) පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ශීර්ෂයන්

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමේ අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. විධිමත් සූදානම් සටහන | 20 | 75 |
| 2. ඉදිරිපත් කිරීම | | |
| 2.1 පිවිසීම | 20 | |
| 2.2 විෂය අන්තර්ගතය (මාතෘකාවට අදාළ වීම) | 20 | |
| 2.3 පාඩම සංවර්ධනය | 20 | |
| 2.4 උපකරණ භාවිතය | 20 | |
| 2.5 කාල කළමනාකරණය | 20 | |
| 2.6 පෞරුෂය හා හඬ පාලනය (ඉදිරිපත් කිරීමේ කුසලතා) | 10 | |

EOG 09 - 0216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.